සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/08/PM/04/E.Power- 2025
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2025.03.07

**සමෘද්ධි චක්‍රලේඛ අංක:- 2025/01ට පළමු එකතුව**

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති/ බැංකු කළමනාකරුවන්.

**ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2025**
**සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී (දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන)**
**පවුල් සවිබලගැන්වීම සඳහා හඳුනා ගැනීම.**

ප්‍රජා සවිබලගැන්වීම් වැඩසටහන 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මගේ සමාංක හා 2025.02.11 දිනැති සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/01 මඟින් දැනටමත් ඔබ වෙත උපදෙස් හා මඟපෙන්වීම් ලබා දී ඇත.

02. එම චක්‍රලේඛය මඟින් නිකුත් කර ඇති උපදෙස් පරිදි, අස්වැසුම සමාජ ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන්ට අදාල නාම ලේඛණය සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය සමඟ සාකච්ඡා කර ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

03. මෙම වැඩසටහන යටතේ, සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම්ලාභී (දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන) පවුල් අතරින් සවිබලගැන්වීම සඳහා සුදුසු පවුල් හඳුනාගැනීම කඩිනම් කර ,අදාල ප්‍රතිලාභීන්ව සවිබලගැන්වීම සඳහා කටයුතු සිදු කිරීමට අදහස් කර ඇත.

04. එබැවින්, සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/01 හි ඡේද අංක 04 මඟින් ප්‍රතිලාභීන් තෝරාගැනීමට හඳුන්වා දී ඇති නිර්ණායකයන් සංශෝධනය කරන අතර, මේ සමඟ ඇති ඇමුණුම -01 හි සඳහන් නව නිර්ණායකයන් භාවිතා කර අස්වැසුම නොලබන සමෘද්ධි සහනාධාර ලැබූ පවුල් අතරින්, සුදුසු පවුල් හඳුනා ගැනීම හා ඊට අදාල වාර්තා සකස් කරන ලෙස දන්වමි.

05. මෙම නිර්ණායක භාවිතා කර සුදුසු පවුල් හඳුනා ගැනීම වසමේ ග්‍රාමීය කමිටුවේ එකඟතාවය මත සිදු කල යුතුය.

06. මේ සම්බන්ධව ,ග්‍රාම නිළධාරි වසම් වල සේවය කරන සමෘද්ධි සංවර්ධන නිළධාරීන් ඇතුළු අනෙකුත් නිළධාරීන් වෙත උපදෙස් හා මගපෙන්වීම් සිදු කරන ලෙස දන්වමි.

07. සැලසුම් කර ඇති පරිදි, පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබගේ සහාය අපේක්ෂා කරමි.

සී.ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

| | | |
|---|---|---|
| 1. | ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය | - කා.දැ.ස |
| 2. | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | - කා.දැ.ස |
| 3. | විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය | - කා.දැ.ස |
| 4. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස |
| 5. | ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස |
| 6. | ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස |
| 7. | සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස |

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී (දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන) පවුල් සවිබලගැන්වීම සඳහා හඳුනාගැනීම.**

**01. ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් සුදුසු අඩුආදායම්ලාභී පවුල් සවිබලගැන්වීම සඳහා හඳුනා ගැනීම.**

i. දැනට නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුව, සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් , වඩාත් සුදුසු පවුල් 12ක් මූලික වශයෙන් තෝරා ගැනීමට කටයුතු කල යුතුය.

ii. මෙම කාණ්ඩය යටතේ පවුල් තෝරා ගැනීමේදී පහත නිර්ණායක සියල්ලම සම්පූර්ණ කරන පවුල් පමණක් තෝරා ගත යුතුය.

1. පවුලේ ගෘහමූලිකයා ,කලත්‍රයා, අවිවාහක දරුවන් යන පුද්ගලයින් අතරින් ක්‍රියාකාරි එක් අයෙකු හෝ අවුරුදු 18-60 ත් අතර වයසේ සිටිය යුතු අතර , තවද එම පවුලේ සාමාජිකයින් ගණන 02 හෝ ඊට වැඩි ගණනක් සිටින පවුලක් විය යුතුය.

2. 2023 වර්ෂයේ ජුනි මස සමෘද්ධි සහනාධාර ලැබූ නාමලේඛණයේ නම ඇතුලත් පවුලක් වීම.

3. සලකා බලන දිනට සමෘද්ධි බැංකුව මඟින් රු.500,000 ට වැඩි ණය මුදලක් ලබාගත් අයෙකු නොවිය යුතුය.

4. 2025 වර්ෂයට. ආසන්නම වර්ෂ 03 ඇතුලත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ලබා දුන් අරමුදලින් ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන මූලාධාර පහසුකමක් ලබානොගත් පවුලක් විම.

5. ආර්ථික ක්ෂේත්‍රය යටතේ සවිබලගැන්වීම සඳහා පහත එක් කාර්යකට යොමු වී ඇති හෝ යොමු කලහැකි පවුලක් විම.
   i. දැනටමත් ඵලදායි ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් කරන අයෙකු/ පවුලක් විම.
   ii. අළුතින්ම ආදායම් උත්පාදන ව්‍යාපෘතියකට යොමු කල හැකි පවුලක් විම.
   iii. වෘත්තිමය පුහුණුවකින් අනතුරුව,ස්වංරැකියාවක හෝ දේශීය/විදේශීය රැකියාවකට යොමුකල හැකි අවු.18-24 අතර තරුණයකු/තරුණියක් සිටීම.

6. සමෘද්ධි බැංකු සමාජිකත්වය හිමි හා සමෘද්ධි බැංකු ණය පැහැරහැරි පවුලක් නොවිම .

7. සවිබලගැන්විම් වැඩසටහනට ඇතුලත්විමට කැමැත්තක් සහිත පවුලක් විම.

**02. තොරතුරු රැස් කිරීම හා කමිටු එකඟතා ලබා ගැනීම.**

i. සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින්, ඉහත ජේද අංක 01 ට අනුව සුදුසුකම් සම්පූර්ණ කරන පවුල් 12 ක් මුලින්ම හඳුනා ගෙන,ඇමුණුම 01(A) ආකෘතියට අනුව තොරතුරු සකස් කර ග්‍රාමීය කමිටුවට ඉදිරිපත් කර, කමිටු බහුතර එකඟතාවය ලබා ගත යුතුය.
ii. ඉන් අනතුරුව,කමිටු එකඟතාවය ලද පවුල් සඳහා මේ සමග ඇමුණුම් -01(B) ආකෘතිය භාවිතා කර , එම එක් එක් පවුල සඳහා අවශ්‍ය තොරතුරු රැස් කල යුතුය.
iii. මෙම ආකෘති පත්‍රය, සමෘද්ධි බැංකු විසින් වියදම් දරා , ජායා පිටපත් කර නිලධාරීන්ට ලබාදිය යුතුය.
iv. ඉන් අනතුරුව තොරතුරු රැස් කරන ලද පවුල් පිළිබඳ තොරතුරු ඇමුණුම් -01(C) අනුව සම්පූර්ණ කර සමෘද්ධි බැංකු කළමනාකරු වෙත භාරදිය යුතුය.
v. ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් පවුල් හඳුනාගැනීම හා බැංකුවට තොරතුරු ලබාදීම 2025.03.17 දිනට පෙර අවසන් කළ යුතුය.

**03. තොරතුරු ලබා දීම සඳහා භාවිතා කළ යුතු ආකෘති හා දිනයන්.**

| තොරතුරු ලබාදෙන පාර්ශවය/ස්ථානය | තොරතුරු යොමුකල යුතු ස්ථානය | තොරතුරු වාර්තා කල යුතු අවසන් දිනය | භාවිතා කල යුතු ආකෘති පත්‍රය |
|---|---|---|---|
| වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී | සමෘද්ධි බැංකු කළමණාකරු | 2025.03.17 | ඇමුණුම-01(C) |
| සමෘද්ධි බැංකුව | සමෘද්ධි බැංකු සමිතිය | 2025.03.24 | ඇමුණුම-01(D) |
| සමෘද්ධි බැංකු සමිතිය | දිස්ත්‍රික් සමෘද්ධි අංශය | 2025.03.28 | ඇමුණුම-01(E) |
| දිස්ත්‍රික් සමෘද්ධි අංශය | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සැලසුම් අංශය (E.mail- dirpm123@gmail.com) | 2025.04.04 | ඇමුණුම-01(E) |